"අපි දෙන්නගේ කේන්දර වෙලූ මොකක්ද අවුලක් කියලා ඒ නැකත හරියන්නේ නෑ කියන්නේ.." රුවන් එහෙම කියනකොට කාව්‍යා පෑන්ට් එකත් ඇඳගෙන ඉවරයි.

"ඉතිං.. දැන් මොකද කියන්නේ එයා.." කාව්‍යා එහෙම කියාගෙනම ඇඳ විට්ටමට කොට්ටයක් තියලා හේත්තු වුනා.

"තව මාස තුනක් ඇතුලත වෙඩින් එක ගන්න ඕනේ කියලා කියන්නේ.." රුවන් බරපතල විදියට එහෙම කියනකොට කාව්‍යාට මුකුත්ම හිතාගන්න බැරිවුනා.

"මොකක්.. පිස්සුද ඒ යකාට.. මාස තුනෙන් වෙඩින් ගන්න කියන්නේ මොනවා ලෑස්ති කරලද.. විකාර.." කාව්‍යාට තදවුනු පාර කාව්‍යා පිස්සුවෙන් වගේ එකදිගටම කියවාගෙන ගියා.

"ඒක තමයි කියන්නේ කාවී.. මම කොහොමද හදිස්සියේ විසා සෙට්ල් කරගන්නේ.. ඒ..මදිවට මට එහෙටනම් එන්න වෙන්නේ අන්තිම මාසේ දිහාටනේ.." රුවනුත් මැදිවුනේ සෑහෙන ප්‍රශ්නයකට.

"අනේ උඹට බම්බු ගහගන්න කියන්න අනේ.. කොහොල්මල් කේන්දරේ.." කාව්‍යා හිටියේ උපරිමයටම තදවෙලා.

"එහෙම කියලා හරියන්නේ නැහැ කාවී.. අපේ ගෙදරිනුත් කියන්නේ ඒවගේ හැටියට කොහොමහරි ඉක්මණටම මේක කරලා දාමු කියලා.." රුවන් එහෙම කියනකොට කාව්‍යාගේ කටට ආපු වචන ටික කාව්‍යා ගිලගත්තේ රුවන් එක්ක මේකට රණ්ඩුවෙලා තේරුමක් නැති හින්දා.

"මං දන්නෑ අයියේ.. මට තේරෙන්නේ නෑ.. මං අපේ අම්මලත් එක්ක කතා කරලා බලන්නම්.. කොහොමත් ගෙවල් දෙකෙන් මේක කතා කරනවා ඇතිනේ.. මං තියන්නම්.." හොඳටම තරහා ගිහිං හිටපු කාව්‍යා කෝල් එක කට් කරලා එහෙම්මම ඇඳේ ගුලි වුනා.

හවස 4 විතර වෙනකොට බෝඩිමට දුෂානි එනකොටත් කාව්‍යා හිටියේ නිදාගෙන. කාව්‍යාව ඇහැරවන්නේ නැතුවම පහළට ගිහිං වොෂ් එකක් දාගෙන ආපු දුෂානි තේ එකකුත් හදාගෙනම ඇවිත් කාව්‍යාගේ ඇඳෙන් වාඩි වුනා.





PDF Drive - Recherchez et téléchargez gratuitement des fichiers PDF.

Click here to access this Book :

**FREE DOWNLOAD**

